# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය , බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | | | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1693/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 10/11/2024<br>පැය 1030 |

## මාධ්‍ය නිවේදනය

### පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2024.11.09 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මිරිහාන පොලිස් වසමේදී වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 52 මිලි ග්‍රෑම් 340 ක් හා ජංගම දුරකථනයක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මිරිහාන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන පැලියගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** මිරිහාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2024.11.09 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් හංවැල්ල පොලිස් වසමේදී වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 10 මිලි ග්‍රෑම් 510 ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 08 මිලි ග්‍රෑම් 570 ක්, මත්ද්‍රව්‍ය අලෙවියෙන් උපයාගත් බවට සැක කරන මුදල් රුපියල් 18500/= ක් හා ජංගම දුරකථනයක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන හංවැල්ල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 47 ක් වන හංවැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** හංවැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. තීරුබදු රහිතව මෙරටට ගෙන්වන ලද දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුර.**

2024.11.08 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ඇහැළියගොඩ පොලිස් වසමේදී වැටලීමක් සිදුකර **තීරුබදු රහිතව මෙරටට ගෙන්වන ලද දුම්වැටි 15020 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇහැළියගොඩ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 49 ක් වන ඇහැළියගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** ඇහැළියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුලියන්කුලම කඳවුර.**

2024.11.09 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුලියන්කුලම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් පුලියන්කුලම පොලිස් වසමේදී වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන පුලියන්කුලම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වන පෝට්ටකුලම් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** පුලියන්කුලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. ගංජා හේන් දෙකක් වටලා සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුර.**

2024.11.09 වන දින උදෑසන සහ දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් තණමල්විල පොලිස් වසමේ ලුණුගම්වෙහෙර ප්‍රදේශයේදී **ගංජා හේන් දෙකක් වටලා අඩියක් පමණ උසින් යුත් ගංජා පැළ 68500 ක් සමඟ සැකකරුවෙකු සහ ගංජා පැළ 68000 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන තණමල්විල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 24 හා 50 වයස්වල පසුවන තණමල්විල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.** තණමල්විල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**